රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 38/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 ජූලි මස [illegible] දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාව ඇති රාජ්‍ය නිලධාරීන්ට
දිරිගැන්වීමේ දීමනා, වැටුප් වර්ධක සහ උසස්වීම්

---

දෙවැනි භාෂාවක හෝ තෙවැනි භාෂාවක ප්‍රවීණතාවය ලබාගන්නා රාජ්‍ය නිලධාරීන්ට දිරිගැන්වීම් ලබාදීම සඳහා පහත දැක්වෙන ක්‍රමය අනුමත කර ඇත.

02. (අ) ජාතික පාසැල්වල ශ්‍රේණිවලට සමාන වූ භාෂා ප්‍රවීණතා මට්ටම් දහයක් (10) ඇති කෙරේ. රාජ්‍ය නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා මට්ටම් මැනීම පිණිස දැනට එවැනි පහසුකම් නොමැති ශ්‍රේණි සඳහා ජාතික මට්ටමේ විභාග අනුකරමින් වසරකට එක් වරක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිවෙලක් යොදනු ඇත. මෙවැනි පරීක්ෂණ (විභාග) වල ලිඛිත සහ වාචික ප්‍රශ්න ඇතුළත් වන අතර වැඩිදුර විස්තර ගැසට් පත්‍රයේ ඉක්මනින් පළකෙරෙනු ඇත.

(ආ) එක් භාෂාවකට ලකුණු පනහක (50 POINTS) උපරිමයකට යටත්ව නිලධාරියකු විසින් සම්පූර්ණ කරනු ලබන එක් ශ්‍රේණියකට ලකුණු පහ (5 POINTS) බැගින් ප්‍රදානය කරනු ඇත. (මෙම චක්‍රලේඛයේ 03 (1) (අ) හි කාර්යය සඳහා)

(ඇ) සම්මුඛ පරීක්ෂණයක දී දෙනු ලබන ලකුණුවලින් (MARKS ) අනුකරමින් සියයට අටක් (8%) එක් භාෂාවක ප්‍රවීණතාව සඳහා දීම පිණිස වෙන් කර තැබිය යුතු අතර තවත් සියයට අටක් (8%) දෙවැනි භාෂාවක ප්‍රවීණතාවය සඳහා දීමට වෙන් කර තැබිය යුතුය. බඳවාගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා මේ අනුව සංශෝධනය කළ යුතුය.

03. (1) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට පහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළත්වීම සඳහා මූලික සාමාන්‍ය සුදුසුකම වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දිරිගැන්වීමේ දීමනා

---

(අ) දෙවැනි භාෂාවක හෝ තෙවැනි භාෂාවක හෝ දෙකෙහිම ප්‍රවීණතාව ලබාගන්නා රාජ්‍ය නිලධාරියෙකුට භාෂා දෙකටම මසකට රුපියල් තුන්සියයක (රු.300/=) උපරිමයකට, යටත්ව මෙම චක්‍රලේඛයේ (02) (ආ) හි සඳහන් වන පරිදි දෙනු ලබන ලකුණකට ( POINT ) රුපියල් තුන (රු.3.00) බැගින් ගෙවනු ලබන මාසික (විශ්‍රාම වැටුප් රහිත) දීමනාවක් ගෙවනු ඇත.

2 පිටුව........(.

✗ (ආ) ඉහත දක්වා ඇති දීමනාවට අමතරව සම්මාන සහිත අ.පො.ස. (සා.පෙ.) මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත් නිලධාරියෙකුට විශේෂ වැටුප් වර්ධකයක් ද (විශ්‍රාම වැටුප් රහිත) විශිෂ්ට සාමාර්ථය ලබා ගත් නිලධාරියෙකු විශේෂ වැටුප් වර්ධකයක් (විශ්‍රාම වැටුප් රහිත) සහ රුපියල් දහසක (රු.1000/=) එකවර ගෙවන ප්‍රසාද මුදලක් ද ගෙවනු ලැබේ. තෙවැනි භාෂාවක් සම්බන්ධවද මෙම දිරිගැන්වීමේ දීමනා ක්‍රමයට අදාළ වේ.

(ඇ) ඉහත 2 (අ) හි සඳහන් ශ්‍රේණි මට්ටමේ භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම මත ඉහත 2 (ඇ) හි සඳහන් ලකුණු ( MARKS ) වල අනුපාතික ප්‍රමාණය සම්මුඛ පරීක්ෂණයක දී ප්‍රදානය කරනු පිණිස වෙන් කළ යුතුය. නිලධාරියෙකු කිසියම් ශ්‍රේණියක වාචික කොටස පමණක් සම්පූර්ණ කරන අවස්ථාවකදී එයට වෙන්කර තබනු ලැබ ඇති ලකුණු ප්‍රමාණයෙන් අඩක් පමණක් ප්‍රදානය කළ යුතුය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකයට වඩා ඉහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළත්වීම සඳහා මූලික සුදුසුකම වන සේවා නිලධාරීන්ට දෙනු ලබන දිරිගැන්වීමේ දීමනා

(අ) මෙම ගණයේ නිලධාරීන්ට ඉහත (3) (1) යටතේ දක්වා ඇති දිරිගැන්වීමේ ක්‍රමය ද අදාළ කරගත යුතුය.

(ආ) ඉහත දක්වා ඇති දීමනා ආදියට අමතරව අධ්‍යයන පොදු සහතික ප (උසස් පෙළ) මට්ටමේ භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කරන මෙම වර්ගයේ නිලධාරියෙකුට තවත් විශේෂ වැටුප් වර්ධකයක් ද (විශ්‍රාම වැටුප් රහිත) රුපියල් එක් දහස් පන්සියයක (රු.1500/=) එකවර ගෙවන ප්‍රසාද මුදලක් ගෙවනු ලැබේ. සම්මාන සාමාර්ථයක් සම්බන්ධයෙන් නම් එයට එකවර ගෙවන ප්‍රසාද මුදල රුපියල් දෙදහසක් (රු.2000/=) වන අතර විශිෂ්ට සාමාර්ථය සම්බන්ධයෙන් නම් එය රුපියල් දෙදහස් පන්සියයක්(රු.2500/=) වනු ඇත. තෙවන භාෂාවක් සම්බන්ධව ද මෙම දිරිගැන්වීමේ දීමනා ගෙවීමේ ක්‍රමයම අදාළ වේ.

(ඇ) ඉහත දක්වා ඇති දීමනාවන්ට අමතරව සාමාන්‍ය ශාස්ත්‍රවේදී මට්ටමේ භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කරන නිලධාරියෙකුට තවත් විශේෂ වැටුප් වර්ධකයක් (විශ්‍රාම වැටුප් රහිත) රුපියල් පන්දහසක (රු.5000/=) එකවර ගෙවන ප්‍රසාද මුදලක් ද ගෙවනු ඇත. තෙවන භාෂාවක් සම්බන්ධව ද මෙම දිරිගැන්වීමේ දීමනා ගෙවීමේ ක්‍රමයට අදාළ වේ.

....3 පිටුව

004. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර හෝ පසුව නැවත ප්‍රතිශතය ලබාගන්නා නිලධාරීහු ඉහත දක්වා ඇති දිරිගැන්වීමේ දීමනා ආදියට හිමිකම් ලබති.

05. අංක 5/88 හා 88.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ගෙවන ලද රැකියල් පඩියයේ (රු.500/=) ප්‍රසාද දීමනාව මෙම ක්‍රමය යටතේ එතෙවර ගෙවන ප්‍රසාද දීමනා වෙන් අඩුකර ගනු ඇත.

06. බඳවාගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා අනුව කිසියම් නිලධාරියෙකු සේවයට ඇතුලත්වීමේ දී ප්‍රශ්නපත්‍රයක් මගයෙන් හෝ සේවයට ඇතුලත්වීමෙන් පසුව හෝ කිසියම් භාෂාවක ප්‍රවීණතාව ලබාගත යුතු යයි නියම කර ඇති විට එවැනි නිලධාරියෙකු එවැනි වර්ගයක භාෂා ප්‍රවීණතාව පෙන්වූවත් පෙනී ඉහත සඳහන් කර ඇති කිසිදු දිරිගැන්වීමේ ක්‍රමයකට හිමිකම් නොලබයි.

07. මෙම දිරිගැන්වීමේ ක්‍රමයේ කාර්යයන් සඳහා පළමු භාෂාව යනු යම් නිලධාරියෙකු රාජ්‍ය සේවයට ඇතුලත්වූ භාෂා මාධ්‍යය වේ. නිලධාරියා සේවයට ඇතුලත්වීමේ භාෂාව අනුව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවන් දෙවැනි භාෂාව වශයෙන් හෝ තෙවැනි භාෂාව වශයෙන් සැලකිය හැකිය.

08. මෙම ක්‍රමය යටතේ ප්‍රදානය කරනු ලබන විශේෂ වැටුප් වර්ධක (විශ්‍රාම වැටුප් රහිත) පෞද්ගලික ලිපිගොනු, ලෙජර් හා වැටුප් පත්‍රිකා වැනි රාජකාරී ලේඛනවල වෙනම වෙන් කර පෙන්විය යුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.